කොවිඩ් සති පාසල

දෙවන වාරය - 4 පාඩම

# ලාක්ෂා කර්මාන්තය



- ❖ ඓතිහාසික පසුබිම

මහනුවර යුගයේදී ලාක්ෂා කර්මාන්තය වඩාත් ප්‍රචලිතව පැවති බවට සාධක පවතී.කොට්ටල් බද්ද නමැති රාජකීය කාර්මික කාර්යංශයේ පවා ඔවුන් සේවය කොට ඇත.එහිදී ඔවුන් හඳුන්වා ඇත්තේ හංගිඩි වසම යනුවෙනි.එම ශිල්පීන් හංගිඩියන් යනුවෙන් මෙම යුගයේදී හඳුන්වා තිබේ.



<u>ප්‍රචලිත ප්‍රදේශ</u>

- මාතලේ - හපුවිද

- තංගල්ල -අඟුල් මඩුව
- මහනුවර -හුරිකඩුව
- බලංගොඩ -පල්ලේකන්ද

මේ අතරින් වර්තමානය වන විටත් මෙම කලා කර්මාන්තය වඩාත් සක්‍රියව පවතින්නේ මාතලේ හපුවිද ප්‍රදේශයේය.

<u>අමුද්‍රව්‍ය</u>

ලාක්ෂා කලා කර්මාන්තය සඳහාවන ප්‍රධාන අමුද්‍රව්‍ය ලාක්ෂාය .මේවා ලාක්ෂා නැමති කෘමියාගෙන් ලබාගනී.

<u>අමුද්‍රව්‍ය සකස්කරගන්නා ආකාරය</u>

ලාක්ෂා කෘමියාගෙන් පිටවන ලාටු වැනි ද්‍රව්‍ය සුළංවැදී ඝන වී ලාක්ෂා බවට පත්වේ.එම ද්‍රව්‍ය අඩංගු අතුරිකිලි කපාගෙන පවනේ වේලා ඒවායේ ඇති ලාක්ෂා පිහියක් වැනි ආයුධයකින් සූරාගත යුතුය ඉන්පසු කපු රෙදි කඩක ඕතා තදින් ගැටගසා ලිපට ඉහලින් එල්ලා රත්කොට උණුවෙන පිරිසිදු ලාක්ෂා මිරිකා ඉවතට ගතයුතුය.එසේ ලබාගත් ලාක්ෂා නැවත රත්කොට කැබලිවලට වෙන්කොට ගනී.

<u>සායම් පිලියෙල කරගන්නා ආකාරය</u>

- රතු -සාදිලිංගම්
- කළු -පහන්දැලි හෝ කැකුණ දැලි
- කහ -හිරියල්
- කොල -කහ හිරියල් සහ නිල්පාට එකතුකොට සාදාගත් ලාක්ෂා කෝටු දෙකක සවිකොට ගෙන රත්කර , සායම්කුඩු මිශ්‍රකර හොදින් පදම ලැබෙනතුරු අදිමින් සකස්කරගත යුතුය.

<u>ලාක්ෂා භාවිතය</u>

දැවමය භාණ්ඩවල මතුපිට අලංකාර කිරීම සඳහා පමණක් ලාක්ෂා භාවිත කෙරේ.

<u>ශිල්ප ක්‍රම</u>

ලාක්ෂා මඟින් සැරසිලි යොදන ප්‍රධාන ශිල්ප ක්‍රම දෙකකි.

- නියපොතු වැඩ

  මෙහිදී ලාක්ෂා කෙදි භාවිත කොට සැරසිලි යොදයි.රත් කළ ලාක්ෂා කැබැල්ල ඇඟිලිවලින් අල්ලා ඇදීමෙන් මෙම දික් කෙදි සකස් කරගත හැකිය.එක් පැහැයක කෙදි භාණ්ඩය මත ඇලවීමෙන් පසු අනිකුත් වර්ණවල කෙදිවලින් මොස්තර යොදනු ලැබේ.මේ සඳහා නියපොත්ත භාවිත කරන බැවින් මෙම ක්‍රමය නියපොතු වැඩ යනුවෙන් හැදින්වේ.

- පට්ටල් වැඩ

පට්ටලයට අල්ලන ලද භාණ්ඩය කැරකැවෙන විට රත්කරගත් ලාක්ෂා කැබැල්ල එයට අල්ලනු ලැබේ.එහිදී භාණ්ඩයේ ලාක්ෂා ඒකාකාරව හොඳින් තැවරේ.විශාල භාණ්ඩ නිර්මාණයේදී මෙම ක්‍රමය බහුලව භාවිත කෙරේ.එසේ එක් වර්ණයක් සම්පූර්ණ භාන්ඩය මත තවරා පසුව මොස්තර යොදනු ලැබේ.

<u>ලාක්ෂාවලින් මෝස්තර යෙදීම සඳහා භාවිතවන සැරසිලි ඒකක</u>.

වැල්පොත පළාපෙති දෙපොට ලණුව ලණු දඟය

තනි බිංදුව ගල් බිංදු කුංදිරක්කන් බෝ කොල

තනිපට ලණුව



<u>ලාක්ෂා ආධාරයෙන් අලංකාර කරනු ලබන භාණ්ඩ</u>.

- සේසත් මිටි කොඩි මිටි හෙල්ල මිටි බීරළු බුලත්තට්ටු සැරයටි වටාපත් මිටි උඩැක්කි කඳන්